# නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව

# சட்ட வரைஞர் திணைக்களம்

# Legal Draftsman's Department

¨

# 2016

## කාර්ය සාධන වාර්තාව

## செயலாற்றுகை அறிக்கை

## Performance Report

## දැක්ම

**යහපත් රාජ්‍ය පාලනයක් ඇති කිරීම සඳහා, ආණ්ඩුවේ නොයෙකුත් ප්‍රතිපත්ති නීතිය බවට පරිවර්තනය කරමින් ශ්‍රී ලංකා ජනරජයට සහාය වීම.**

## මෙහෙවර

**ආණ්ඩුවේ ප්‍රතිපත්ති නීතිය බවට පරිවර්තනය කිරීමේ දී, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව ඊට අදාළ පනත් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා තුනෙන්ම සම්පාදනය කිරීම.**

# හැඳින්වීම

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව "ඒ" ශ්‍රේණියේ රාජ්‍ය දෙපාර්තමේන්තුවකි. අතිගරු ජනාධිපතිතුමාගේ සෘජු අධීක්ෂණය යටතේ පැවති මෙම දෙපාර්තමේන්තුව අංක 1897/15 හා 2015.01.18 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව අධිකරණ හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණය යටතට පත් වූ අතර, අංක 1933/13 හා 2015.09.21 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව අධිකරණ අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණය යටතේ කටයුතු කරයි.

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවෙහි ප්‍රධාන කාර්යභාරය වනුයේ, අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද තීරණ අනුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව, විවිධ විෂයයන් පිළිබඳ ආණ්ඩුවේ ප්‍රතිපත්ති ලිඛිත නීති බවට පරිවර්තනය කිරීම වේ. එසේ ආණ්ඩුවේ ප්‍රතිපත්ති නීතිය බවට පරිවර්තනය කිරීමේ කාර්යාවලියේ දී, දෙපාර්තමේන්තුව විසින්, නව නීති පැනවීම සඳහා පනත් කෙටුම්පත් සම්පාදනය කිරීම, පවත්නා නීති සංශෝධනය කිරීමේ පනත් කෙටුම්පත් සම්පාදනය කිරීම සහ ආණ්ඩුවේ විවිධ අමාත්‍යාංශවලින් ඉදිරිපත් කරන අනුනීති ප්‍රතිශෝධනය කිරීම සිදු කරයි. පනත් කෙටුම්පත් සමාලෝචනය කිරීම සඳහා වන පාර්ලිමේන්තු තේරීම් කාරක සභා රැස්වීම්වලට සහභාගී වීම සහ පනත් කෙටුම්පත් විවාදයට ගැනීමේ දී පාර්ලිමේන්තුව සමඟ සම්බන්ධීකරණය පවත්වා ගනිමින් අවශ්‍ය කටයුතු කිරීම දෙපාර්තමේන්තුවට පැවරී ඇති අනෙකුත් රාජකාරී කටයුතු වේ. මෙම දෙපාර්තමේන්තුව, සියලු රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ද ඇතුළුව ආණ්ඩුවේ සියලු අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත සේවා සලසයි. පනත් කෙටුම්පත් සහ අනුනීති සැකසීම සම්බන්ධයෙන් නොයෙකුත් ආණ්ඩුවේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට නෛතික උපදෙස් ලබාදීම ද, දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි.

**1. පනත් කෙටුම්පත් සම්පාදනය කිරීමට අදාළව දෙපාර්තමේන්තුවේ කර්තව්‍ය වනුයේ:-**

(1) නව නීති පැනවීම සඳහා ද පවත්නා නීති සංශෝධනය කිරීම සඳහා ද භාෂාත්‍රයෙන් පනත් කෙටුම්පත් සම්පාදනය කිරීම.

(2) අනුනීති භාෂාත්‍රයෙන් ප්‍රතිශෝධනය කිරීම සහ (අවශ්‍ය අවස්ථාවල දී) අනුනීති කෙටුම්පත් කිරීම.

(3) නීති සම්පාදනය හා සම්බන්ධ පාර්ලිමේන්තු රාජකාරී ඉටු කිරීම.

(4) පළාත් සභා සඳහා ප්‍රඥප්ති කෙටුම්පත් කිරීම.

(5) පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත් (සංස්ථාගත කිරීමේ පනත් කෙටුම්පත්) භාෂාත්‍රයෙන් ප්‍රතිශෝධනය කිරීම.

පනත්, උපකාරක නීති, සහ පළාත් සභා ප්‍රඥප්ති කෙටුම්පත් කිරීමේදී ඒ සම්බන්ධව අවශ්‍ය වන නෛතික උපදෙස් ලබා දීම ද මෙම දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලැබේ.

මෙම දෙපාර්තමේන්තුවේ විශේෂ ලක්ෂණය වන්නේ, එයටම සීමා වූ වැඩසටහනක් නොතිබීම යි. අමාත්‍ය මණ්ඩලය විසින් නියමිත ප්‍රතිපත්ති අනුමත කිරීමෙන් පසුව, ආණ්ඩුවේ අමාත්‍යාංශවල හා එම අමාත්‍යාංශ යටතේ ඇති විවිධ දෙපාර්තමේන්තුවල ව්‍යවස්ථා සම්පාදන අවශ්‍යතා මත දෙපාර්තමේන්තුවේ වැඩසටහන සකස් වී තිබීම ඊට හේතුව යි. එබැවින් නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය, යම් නිශ්චිත වර්ෂයක් මුළුල්ලේ ප්‍රාථමික නීති, නීති සංශෝධන හා උපකාරක නීති සම්බන්ධයෙන් අදාළ රේඛීය අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් හා එම ඉල්ලීම් සාර්ථකව නිම කිරීම යන පදනම මත සකස් වී ඇත. දෙපාර්තමේන්තුවේ මූලික කාර්යභාරය වන නීති සම්පාදනයෙහි විෂය පථයට ඇතුළත් වන කවර ආකාරයක හෝ වූ නීති, එය ඉල්ලා සිටින අමාත්‍යාංශයට හෝ දෙපාර්තමේන්තුවට මුද්‍රා හැරීමට පෙර භාෂා තුනෙන් ම සම්පූර්ණ කරනු ලැබිය යුතු ය.

## 2. කාර්ය මණ්ඩලය

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල සංයුතිය පහත සඳහන් පරිදි වේ. අනුමත ඒකාබද්ධ කාර්ය මණ්ඩලය 143 ක් වන අතර 2016.12.31 දිනට සේවයේ නියුතුව සිටි කාර්ය මණ්ඩලය 111 ක් වේ.

| තනතුරු වර්ග | අනුමත කාර්ය මණ්ඩලය | සේවයේ නියුතුව සිටි කාර්ය මණ්ඩලය |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 37 | 30 |
| තෘතීය මට්ටම | 28 | 16 |
| ද්විතීය මට්ටම | 62 | 43 |
| ප්‍රාථමික මට්ටම | 24 | 22 |

| 2016.12.31 දිනට නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | | | තෘතීය මට්ටම | | | ද්විතීය මට්ටම | | | ප්‍රාථමික මට්ටම | | |
| | අනුමත | තත්‍ය | | අනුමත | තත්‍ය | | අනුමත | තත්‍ය | | අනුමත | තත්‍ය |
| නීති කෙටුම්පත් සම්පාදක | 01 | 01 | පරිපාලන නිලධාරී | 01 | - | සංවර්ධන සහකාර | 02 | - | රියදුරු | 10 | 09 |
| අතිරේක නීති කෙටුම්පත් සම්පාදක | 01 | 01 | ප්‍රධාන භාෂා පරිවර්තක | 02 | 02 | පුස්තකාලයාධිපති | 01 | 01 | කාර්යාල කාර්ය සහායක | 14 | 13 |
| නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදක | 05 | 04<br>01<br>(වැ.බ.) | භාෂා පරිවර්තක | 24 | 13 | රාජ්‍ය කළමනාකරණ සහකාර | 20 | 17 | | | |
| ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදක | 08 | 01 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | 01 | 01 | ලේඛන සහකාර | 20 | 15 | | | |
| සහකාර නීති කෙටුම්පත් සම්පාදක | 20 | 20 | | | | සංස්කාරක | 11 | 10 | | | |
| ප්‍රධාන ගණකාධිකාරී | 01 | 01 | | | | | | | | | |
| සහකාර අධ්‍යක්ෂ | 01 | 01 | | | | | | | | | |
| එකතුව | 37 | 30 | | 28 | 16 | | 54 | 43 | | 24 | 22 |
| මුළු එකතුව | | | | අනුමත ගණන 143 | | | තත්‍ය ගණන: 111 | | | | |

* කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක DMS/1008 හා 2016.11.7 දිනැති ලිපිය මගින් ලැබූ අනුමතයෙහි නියමයන් පරිදි අනුමත රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ තනතුරු සංඛ්‍යාව 20 ක් ලෙස සංශෝධනය වී ඇත.

## දෙපාර්තමේන්තුවේ පවත්නා පුරප්පාඩු පිරවීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග

දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්යභාරය ඉටුකිරීම සඳහා අනුමත සේවක සංඛ්‍යාව 143 කි. එසේ වුව ද එකී කාර්යභාරය ඉටුකිරීම සඳහා දෙපාර්තමේන්තුවේ 2016 වර්ෂයේ සිටි තත්‍ය සේවක සංඛ්‍යාව 111 ක් පමණි. මෙහි පහත දක්වා ඇති පරිදි විවිධ සේවා ගණවල සේවා නියුක්තිය සම්බන්ධයෙන් පුරප්පාඩු 32 ක් ඇත :-

### ජ්‍යෙෂ්ඨ මට්ටම

(අ) නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදක ධුරයේ පුරප්පාඩු නැත. ස්ථිර නිලධාරීන් 04ක් සහ වැඩබලන නිලධාරීන් 01 ක් සිටියි. වැඩ බලන තනතුරු 1ක් පිරවීම සඳහා අයදුම්පත් කැඳවීමට කටයුතු කරගෙන යනු ලැබේ.

(ආ) ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදක තනතුරු 07 ක් පුරප්පාඩුව පවතී. අනුමත බඳවා ගැනීමේ පටිපාටියට අනුව සුදුසුකම්ලත් එනම්, වසර දහයක (10) සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සහකාර නීති කෙටුම්පත් සම්පාදක නිලධාරීන් නොමැති බැවින් එම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට දැනට සිටින සහකාර නීති කෙටුම්පත් සම්පාදක නිලධාරීන් අදාළ සේවා කාලය සම්පූර්ණ කළ යුතු ය.

(ඇ) සහකාර නීති කෙටුම්පත් සම්පාදක පුරප්පාඩු නැත.

### තෘතීය මට්ටම

පරිපාලන නිලධාරී තනතුර පුරප්පාඩුව පවතී. පුරප්පාඩුව සම්බන්ධව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා යවා ඇති අතර, පිළිතුරු මේ වන තෙක් ලැබී නොමැත.

(අ) භාෂා පරිවර්තක තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා 2016.09.04 දින ලිඛිත විභාගයක් පවත්වන ලද අතර, සිංහල, දෙමළ අයදුම්කරුවන් 16 දෙනෙකු සමත්ව තිබුණි. එයින් සුදුසුකම්ලත් සිංහල මාධ්‍ය 10 දෙනෙකු සහ දෙමළ මාධ්‍ය 03 දෙනෙකු පමණක් වැඩ භාරගෙන ඇත. (පත්වීම් පිළිවෙළින් 2016.12.01 සහ 2016.12.20 දාතමින් වේ.)

(ආ) ඒ අනුව 2016.12.31 දින වන විට පුරප්පාඩු

| | |
|---|---|
| ඉංග්‍රීසි/සිංහල භාෂා පරිවර්තක තනතුරු | - 03 ක් සහ |
| ඉංග්‍රීසි/දෙමළ භාෂා පරිවර්තක තනතුරු | - 08 ක්, පවතී. |

## ද්විතීය මට්ටම

(අ) සංවර්ධන සහකාර නිලධාරි දෙදෙනෙකු ලබාදෙන ලෙස 2016.10.11 දින දරන ලිපිය මගින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා ඇත.

(ආ) 2016.12.31 දිනට ලේඛන සහකාර තනතුරෙහි පුරප්පාඩු 05 ක් හා සංස්කාරක තනතුරෙහි පුරප්පාඩු 01 ක් පවතී. ලිඛිත විභාගයේ ප්‍රතිඵල මත 2016.08.23 දින නැවත සම්මුඛ පරීක්ෂණයක් පවත්වා එහි ප්‍රතිඵල මත 2016.09.15 දින ලේඛන සහකාර 08 දෙනෙකු හා සංස්කාරක නිලධාරීන් 08 දෙනෙකු බඳවා ගන්නා ලදී.

## ප්‍රාථමික මට්ටම

(අ) රියදුරු සේවයේ එක් පුරප්පාඩුවක් පවතී. පුරප්පාඩුව සම්බන්ධව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා යවා ඇත.

(ආ) කාර්යාල කාර්ය සහායක එක් පුරප්පාඩුවක් පවතී. ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යවා ඇත.

## 3. දෙපාර්තමේන්තුවේ අංශ

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ කාර්යය පහත සඳහන් අංශ මඟින් ක්‍රියාත්මක වේ.

නීති කෙටුම්පත් සම්පාදන අංශය

ආයතන හා පාලන අංශය

භාෂා පරිවර්තන අංශය

ප්‍රකාශන අංශය

ගිණුම් අංශය

# නීති කෙටුම්පත් සම්පාදන අංශය

**ක්‍රියාත්මක කරන ප්‍රධාන කාර්යයන් ඃ-**

- ආණ්ඩුවේ ප්‍රතිපත්ති නීතිය බවට පරිවර්තනය කිරීම.
- නව නීති පැනවීමට සහ නීති සංශෝධනය කිරීමට භාෂාත්‍රයෙන් පනත් කෙටුම්පත් සකස් කිරීම.
- ආණ්ඩුවේ නොයෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් නෛතික උපදෙස් ලබා දීම.
- නීති සම්පාදනය හා සම්බන්ධ පාර්ලිමේන්තු රාජකාරි ඉටු කිරීම.
- පළාත් සභා සඳහා ප්‍රඥප්ති කෙටුම්පත් කිරීම.

# ප්‍රගති සමාලෝචනය - 2016.01.01-2016.12.31

| | රාජකාරියේ ස්වභාවය | 2016.01.01 දිනට කෙටුම්පත් කිරීම අවසන් නොවූ ඉල්ලීම් සංඛ්‍යාව | වර්ෂය තුළ පාර්ශ්වයන් වෙතින් ලැබුණු ඉල්ලීම් සංඛ්‍යාව | එකතුව | 2016.12.31 දිනට කෙටුම්පත් සකස් කර අදාළ පාර්ශ්වයන් වෙත ලබා දුන් සංඛ්‍යාව | දීර්ඝ කාලීනව උපදෙස් නොමැතිව වසන ලද ගොනු | කෙටුම්පත් කර මූලික හෝ අවසන් කෙටුම්පත් වශයෙන් භාරදී නීතිපති හා අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙතින් නිරීක්ෂණ හා උපදෙස් බලාපොරොත්තුවෙන් ඉතිරිව පවතින ඉල්ලීම් සංඛ්‍යාව | 2016.12.31කෙටුම්පත් කිරීම අවසන් නොවූ ඉල්ලීම් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|
| 1. | පනත් කෙටුම්පත් කිරීම (මූලික හා සංශෝධන නීති ) | 194 | 73 | 267 | 54 | 54 | 138 | **21** |
| 2. | උපකාරක නීති (මූලික හා සංශෝධන) | 124 | 132 | 256 | 119 | 01 | 119 | **17** |
| 3. | පළාත් සහා ප්‍රඥප්ති | 23 | 3 | 26 | 1 | - | 23 | **2** |

**සැ.යු.**

මෙම දෙපාර්තමේන්තුව විසින් අවධානය යොමුකර සම්පූර්ණ කරනු ලැබ කෙටුම්පත් යවනු ලැබුවාවූ ඉල්ලීමක්, ප්‍රධාන වශයෙන් උපදෙස් ලබාදෙනු ලබන නියෝජ්‍යායතන විසින් තම ප්‍රතිපත්තිය නිරන්තරයෙන් වෙනස් කිරීමේ හේතුව මත, තවදුරටත් වූ සංශෝධන සඳහා අලුත් උපදෙස් ද සමග ඉදිරිපත් කරනු ලැබේ. එසේ වුවද එවැනි ඉල්ලීමක් ලැබුන විට එම ඉල්ලීමට අදාළ කෙටුම්පත අවසාන වශයෙන් සකස් කර තිබීම නොසලකා අලුතින් සිදුකරනු ලබන ඉල්ලීමක් සඳහා මෙන් එම ඉල්ලීම පිළිබඳව නැවත අවධානය යොමුකිරීමට හා කාලය වැය කිරීමට මෙම දෙපාර්තමේන්තුවට සිදුවේ. වැඩිදුරටත් සම්පූර්ණ කරන ලද කෙටුම්පත් සඳහා එවැනි සංශෝධන සිදුකිරීමට කරනු ලබන ඉල්ලීම් අවසාන කෙටුම්පත භාෂාත්‍රයෙන් යවනු ලැබීමෙන් පසුවද සිදු කරනු ලබන අතර ඇතැම්විට එම කාර්ය පටිපාටිය නැවත නැවතත් වාර ගණනක් ඉටු කිරීමට සිදුවේ. පහතින් ඒ සඳහා නිදසුන් කිහිපයක් ඉදිරිපත්කර ඇත.

| පනත් කෙටුම්පතේ නම | කෙටුම්පත් යවා ඇති වාර ගණන (2016.12.31 දිනට) |
|---|---|
| ජාතික විගණන පනත් කෙටුම්පත | 20 |
| මෝටර් ප්‍රවාහන පනත් කෙටුම්පත | 16 |
| රජයේ ඉඩම් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත | 10 |
| ඉඩම් බැංකු පිහිටුවීමේ පනත් කෙටුම්පත | 07 |
| ඉඩම් සංවර්ධන ආඥා පනත් කෙටුම්පත | 12 |
| ජෙනරාල් සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල පනත් කෙටුම්පත | 06 |
| ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනත් කෙටුම්පත | 06 |
| ස්වේච්ඡා සමාජ සේවා (ලියාපදිංචි කිරීමේ හා අධීක්ෂණය කිරීමේ) පනත් කෙටුම්පත | 10 |
| ජාතික අක්ෂි බැංකු පනත් කෙටුම්පත | 07 |
| පළාත් පාලන මැතිවරණ (සංශෝධන) පනත් කෙටුම්පත | 09 |

එහෙයින්, මෙම දෙපාර්තමේන්තුව විසින් යම් ඉල්ලීමක් සඳහා අවධානය යොමුකර එය සම්පූර්ණ කර තිබුණ ද ඉහත හේතුව මත එම ඉල්ලීම තවදුරටත් මෙම දෙපාර්තමේන්තුව විසින් "කෙටුම්පත් කිරීම අවසන් නොවූ ඉල්ලීමක්" වශයෙන් පෙන්නුම් කරනු ලැබේ.

පෞද්ගලික මන්ත්‍රී (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත්

**1.** අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවේ උපදෙස් පරිදි විගණන පනත, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත හා රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ පනත සම්මත වනතෙක් පෞද්ගලික මන්ත්‍රී (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත් සම්බන්ධ කටයුතු නැවත අප වෙත දන්වන තුරු තාවකාලිකව නතර කර ඇත. එම හේතුව නිසා 2016.12.31 දින වනවිට පෞද්ගලික මන්ත්‍රී (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත් කිරීම අවසන් නොවී නවතා ඇති ප්‍රමාණය 108 කි.

පනත් කෙටුම්පත් (මූලික හා සංශෝධන නීති)

**2.** පනත් කෙටුම්පත් (මූලික හා සංශෝධන නීති): අවසන් නොවූ ඉල්ලීම් 21 කි. අදාළ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතනවල උපදෙස් හෝ නිරීක්ෂණ හෝ අවශ්‍ය කැබිනට් අනුමතය ලැබී නොමැති හෝ තවමත් සාකච්ඡා මට්ටමින් පවතින හෝ ඒවා වේ.

උපකාරක නීති ප්‍රතිශෝධනය (නියෝග, නියම, රීති ආදිය)

**3.** (උපකාරක නීති): සංශෝධනය කිරීම අවසන් නොවූ ඉල්ලීම් සංඛ්‍යාව 17 කි. අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතනවල උපදෙස් හෝ නිරීක්ෂණ අවශ්‍ය වන හෝ තවමත් සාකච්ඡා මට්ටමින් පවතින හෝ ඒවා වේ.

# පාර්ලිමේන්තුවේ සම්මත වූ පනත් (2016)

| පනත් අංකය | පනතේ නම | ගොනුවේ අංකය | සම්මත වූ දිනය |
|---|---|---|---|
| 01 | පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත | එල්.ඩී.ඕ. 50/2015 | 2016.02.19 |
| 02 | ධීවර හා ජලජ සම්පත් (සංශෝධන) පනත | එල්.ඩී.ඕ. 46/2015 | 2016.02.17 |
| 03 | සේවකයින්ගේ ජාතික අවම වේතන පනත | එල්.ඩී.ඕ. 51/2015 | 2016.03.23 |
| 04 | සේවකයින්ගේ අයවැය සහන දීමනාව පනත | එල්.ඩී.ඕ. 27/2015 | 2016.03.23 |
| 05 | කාලාවරෝධ (විශේෂ විධිවිධාන) පනත | එල්.ඩී.ඕ. 21/2010 | 2016.04.26 |
| 06 | ක්ෂුද්‍ර මූල්‍ය පනත | එල්.ඩී.ඕ. 32/2012 | 2016.05.20 |
| 07 | ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකු ගිවිසුම (අපරානුමත කිරීමේ) පනත | එල්.ඩී.ඕ. 04/2016 | 2016.05.30 |
| 08 | පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත | එල්.ඩී.ඕ. 33/2013 | 2016.06.26 |
| 09 | සමථ මණ්ඩල (සංශෝධන) පනත | එල්.ඩී.ඕ. 60/2015 | 2016.07.08 |
| 10 | හෝමියෝපති පනත | එල්.ඩී.ඕ. 46/2005 | 2016.07.05 |
| 11 | ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව පනත | එල්.ඩී.ඕ. 28/2014 | 2016.07.07 |
| 12 | තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත | එල්.ඩී.ඕ. 04/2015 | 2016.06.24 |
| 13 | මූල්‍ය කළමනාකරණ (වගකීම) (සංශෝධන) පනත | එල්.ඩී.ඕ. 16/2016 | 2016.08.09 |
| 14 | අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම, කර්තව්‍යය ඉටුකිරීම) පනත | එල්.ඩී.ඕ. 32/2016 | 2016.11.01 |
| 15 | සත්ව ආහාර පනත | එල්.ඩී.ඕ. 60/2006 | 2016.08.23 |
| 16 | මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විශේෂ විධිවිධාන ) (සංශෝධන) පනත | එල්.ඩී.ඕ. 41/2015 | 2016.08.25 |
| 17 | විශ්වවිද්‍යාල (සංශෝධන) පනත | එල්.ඩී.ඕ. 35/2013 | 2016.10.05 |
| 18 | අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත | එල්.ඩී.ඕ. 44/2015 | 2016.10.17 |
| 19 | නීති කොමිෂන් සභා (සංශෝධන) පනත | එල්.ඩී.ඕ. 52/2015 | 2016.10.17 |
| 20 | එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත | එල්.ඩී.ඕ. 27/2016 | 2016.10.26 |
| 21 | වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු (සංශෝධන) පනත | එල්.ඩී.ඕ. 15/2016 | 2016.11.07 |
| 22 | ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත | එල්.ඩී.ඕ. 28/2016 | 2016.11.07 |
| 23 | විසර්ජන (සංශෝධන) පනත | එල්.ඩී.ඕ. 34/2016 | 2016.11.07 |
| 24 | විසර්ජන පනත | එල්.ඩී.ඕ. 53/2016 | 2016.12.10 |

සටහන ඃ

- එල්.ඞී.ඕ. යනුවෙන් අදහස් වන්නේ නව නීති හා සංශෝධන නීතිවලට අදාළ පනත් කෙටුම්පත් ලිපිගොනු වේ.

- එල්.ඞී.ඕ. අයි.එන්.සී. යනුවෙන් අදහස් වන්නේ පෞද්ගලික මන්ත්‍රීන්ගේ සංස්ථාගත කිරීමේ පනත් කෙටුම්පත්වලට අදාළ ලිපිගොනු වේ.

## ආයතන අංශය හා පාලන අංශය

ආයතන හා පාලන අංශය මගින් කාර්ය මණ්ඩලය බඳවා ගැනීම, උසස් කිරීම, පුහුණු කිරීම, කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම හා විනය කටයුතු, ප්‍රවාහන පහසුකම් හා සම්බන්ධ කටයුතු සහ දෙපාර්තමේන්තුවේ අනෙකුත් සියලු ආයතනික හා පරිපාලන කටයුතු ඉටු කරනු ලබයි.

### (1) බඳවා ගැනීම්, උසස් කිරීම් සහ විනය පාලනය

නීති කෙටුම්පත් සම්පාදකවරයා විශ්‍රාම යෑම හේතුවෙන් පුරප්පාඩු වූ තනතුර සඳහා එවකට අතිරේක නීති කෙටුම්පත් සම්පාදකවරිය ලෙස කටයුතු කළ නිලධාරිනිය නීති කෙටුම්පත් සම්පාදක තනතුරට උසස් කරන ලදී.

### (2) පුහුණු කිරීම්

**දේශීය පුහුණු කිරීම්**

**දේශීය පුහුණු කිරීම් පහත දක්වා ඇති පරිදි නිලධාරීන්ට ලබාදෙන ලදී.**

| ආයතනය | තනතුර | සහභාගි වූ නිලධාරීන් ගණන | පාඨමාලාව |
|---|---|---|---|
| කොළඹ විශ්වවිද්‍යාලය | සහකාර නීති කෙටුම්පත් සම්පාදක | 01 | දර්ශනපති/ආචාර්ය උපාධිය |
| සෞඛ්‍ය අමාත්‍යාංශය | සහකාර නීති කෙටුම්පත් සම්පාදක | 01 | ශ්‍රී ලංකාවේ මව් කිරි දීම පිළිබඳ නීති සංග්‍රහය සැකසීම සම්බන්ධයෙන් වූ අධීක්ෂණය සහ ක්‍රියාත්මක කිරීමේ වැඩමුළුව |
| ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය | ප්‍රධාන ගණකාධිකාරි | 01 | වත්කම් කළමනාකරණ පුහුණු වැඩසටහන |
| ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | භාෂා පරිවර්තක | 01 | තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව |
| | ලේඛන සහකාර | 02 | රාජ්‍ය සේවයේ ආකල්ප වර්ධනය පිළිබඳ පුහුණු පාඨමාලාව |
| මිලෝදා ආයතනය | කළමනාකරණ සහකාර | 02 | CIGAS පුහුණු වැඩසටහන |
| | සංස්කාරක | 01 | විධිමත් ලිපි ලිවීමේ නිපුණතා වැඩමුළුව |

| | | | |
|---|---|---|---|
| **නිපුණතා සංවර්ධන අරමුදල** | තොරතුරු තාක්ෂණ නිලධාරි | **01** | තොරතුරු තාක්ෂණයට අදාළ භාණ්ඩ ප්‍රසම්පාදන සහ ඇගයීම පිළිබඳ වැඩමුළුව |
| | කළමනාකරණ සහකාර | **02** | ගබඩා කළමනාකරණය සහ මිලදී ගැනීම් මේ කාර්ය පටිපාටිය පිළිබඳ වැඩමුළුව |
| | | **03** | කාර්යාල උපකරණ පාලනය පිළිබඳ පුහුණු වැඩසටහන |
| | | **01** | නිවාඩු ලිපිකරුවන්ගේ කාර්යභාරය හා වගකීම |
| **නිපුණතා සංවර්ධන අරමුදල** | කළමනාකරණ සහකාර | **02** | වැටුප් පරිවර්තන පුහුණු වැඩසටහන |
| | | **02** | සිවිල් විශ්‍රාම වැටුප් ගණන් බැලීම හා ගෙවීම පිළිබඳ පුහුණුව |
| | රියදුරු | **04** | ආකල්ප හා වෘත්තීය දැනුම ඉහළ නැංවීම සහ වාහන නඩත්තුව පිළිබඳ පුහුණුව |
| **ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය** | කළමනාකරණ සහකාර | **01** | විනය කාර්ය පටිපාටි (දෙමළ මාධ්‍ය) |
| | | **02** | ලිපිගොනුකරණය පුහුණු වැඩසටහන |
| | | **01** | ප්‍රසම්පාදන ක්‍රියාවලිය පුහුණු වැඩසටහන |
| | | **01** | රථවාහන හා යන්ත්‍ර සූත්‍ර පරිපාලනය |
| | ලේඛන සහකාර | **02** | ලිපිගොනුකරණය |
| | රියදුරු | **03** | රියදුරු මහතුන්ගේ කුසලතා සංවර්ධන පුහුණු වැඩසටහන |
| | කාර්යාල කාර්ය සහායක | **02** | ඉහළ ශ්‍රම ඵලදායිතාවය |

| | | | |
|---|---|---|---|
| **ඉදිකිරීම යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය** | රියදුරු | **03** | විද්‍යාත්මක, පිරිමැසුම්දායක සහ ආරක්ෂක රිය පැදවීම |

**විදේශීය පුහුණු**

| නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් සහභාගී වූ විදේශ පුහුණු - 2016 වර්ෂය | | |
|---|---|---|
| | පුහුණුවේ නම සහ පැවැත් වූ රට | සහභාගී වූ නිලධාරියාගේ නම |
| 1. | මුදල් විශුද්ධිකරණය පිළිබඳ APG - සමූහ විනාශ අවි ප්‍රගුණකයට එරෙහි ඉලක්කගත මූල්‍යමය වගන්ති ක්‍රියාත්මක කිරීමේ වැඩමුළුව - 2016 මාර්තු 9–11, මැලේසියාව | සහකාර නීති කෙටුම්පත් සම්පාදක වී.එල්. දයාරත්න මෙනෙවිය, සහකාර නීති කෙටුම්පත් සම්පාදක ජී.කේ. හේවාවිතාන මහතා |
| 2. | ජාත්‍යන්තර නීති ව්‍යවස්ථා කෙටුම්පත් කිරීම - 2016 - පොදු නීති මධ්‍යස්ථානය, නිව් ඕලියන්ස්, ලුසියානා, ඇමෙරිකා එක්සත් ජනපදය, 2016 ජූනි 13-24 | නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදක එස්. සෙල්වකුනපාලන් මහතා<br><br>ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදක එස්.එස්.එම්.ඩී.ඊ. වීරකෝන් මිය<br><br>සහකාර නීති කෙටුම්පත් සම්පාදක සී.බී. කපුරුබණ්ඩාර මිය<br><br>සහකාර නීති කෙටුම්පත් සම්පාදක ජී.ඒ.එස්. ක්‍රිෂාන්ති මිය<br><br>සහකාර නීති කෙටුම්පත් සම්පාදක එල්.ජී. පුංචිහේවා මිය |

| | | |
|---|---|---|
| 3. | නීති කෙටුම්පත් සම්පාදනය කිරීමේ පාඨමාලාව 2016 – එක්සත් රාජධානිය 2016 ජූනි 20 – 2016 ජූලි 15 | සහකාර නීති කෙටුම්පත් සම්පාදක වී.එල්. දයාරත්න මෙනවිය<br><br>සහකාර නීති කෙටුම්පත් සම්පාදක බී.කේ.එන්. ද සිල්වා මිය<br><br>සහකාර නීති කෙටුම්පත් සම්පාදක ජී.කේ. හේවාවිතාන මහතා |
| 4. | උසස් නීති කෙටුම්පත් සම්පාදනය කිරීම. - 2016 ඇමෙරිකා එක්සත් ජනපදය<br>-2016 අගෝස්තු 15-26 | නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදක ඩී.ඩී. කුලසේන මෙනවිය<br><br>සහකාර නීති කෙටුම්පත් සම්පාදක යූ.එම්. සපුකොටන මිය |
| 5. | අවදානම් සහ වෙනස්වීම් කළමනාකරණය කිරීමේ ජාත්‍යන්තර වැඩසටහන සහ අධ්‍යයන චාරිකාව මැලේසියාව<br>2016 ඔක්තෝබර් 23 -30 | ප්‍රධාන ගණකාධිකාරී ටී.ටී.එන්. ප්‍රනාන්දු මිය |
| 6. | රාජ්‍ය නිලධාරීන් සඳහා වන විද්‍යුත් - රාජ්‍ය පුහුණු වැඩසටහන - කොරියාව - 2016 ඔක්තෝම්බර් - 24<br>2016 නොවැම්බර් 04, | සහකාර නීති කෙටුම්පත් සම්පාදක ආර්.පී. කොඩිතුවක්කු මෙනවිය |
| 7. | MENAF ATF/APG හවුල් ස්ථලක සහ හැකියා වර්ධනය කිරීමේ වැඩමුළුව - 2016 - සෞදි අරාබිය<br><br>2016 නොවැම්බර් 28-<br>2016 දෙසැම්බර් 01 | සහකාර නීති කෙටුම්පත් සම්පාදක යූ.එම්. සපුකොටන මිය |
| | **සහභාගි වූ රැස්වීම්** | |
| 1. | APG – 19th වන වාර්ෂික රැස්වීම තාක්ෂණික සහාය සඳහා වූ සමුළුව - 2016 - ඇමෙරිකාව | නීති කෙටුම්පත් සම්පාදක ඩී. එස්. එච්. කුමාරජීව මිය |

**නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් සහභාගී වූ විදේශීය සමුළු - 2016 වර්ෂය**

| | සමුළුවේ නම සහ පැවැත් වූ රට | සහභාගී වූ නිලධාරියාගේ නම |
|---|---|---|
| 01. | බුද්ධිමය දේපළ තාක්ෂණය පිළිබඳ ආසියානු නීති සමුළුව<br>2016 නොවැම්බර් 17 - 18 | ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදක<br>ඩී.ඩී. වීරක්කොඩි මිය<br><br>සහකාර නීති කෙටුම්පත් සම්පාදක<br>වී. එස්. තුෂාරි මහත්මිය |
| 02. | සයිබර් සුරක්ෂණය සහ අන්තර්ජාල පාලනය පිළිබඳ සමුළුව - ඉන්දියාව<br>2016 සැප්තැම්බර් 28 – 30 | සහකාර නීති කෙටුම්පත් සම්පාදක<br>ඩී. එම්. කේ. ඩී. කේ. දිසානායක මහත්මිය |
| 03. | පරජාතික සංවිහිත අපරාධවලට එරෙහිව එක්සත් ජාතීන්ගේ සම්මුතියේ සාමාජිකයන් මත වූ සමුළුව<br>(UNTOC - ඔස්ට්‍රේලියාව)<br>2016 ඔක්තෝබර් 17 – 21) | සහකාර නීති කෙටුම්පත් සම්පාදක<br>බී. කේ. එන් ද සිල්වා මහත්මිය |
| 04. | සයිබර් අපරාධ කමිටුව - ප්‍රංශය<br>2016 මැයි 23 - 26 | නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදක<br>ටී. ඒ. වයි. එම්. රණවන මහත්මිය |
| 05. | සයිබර් අපරාධ සමුළුව මත වන ගෝලීය පැවැත්ම - රුමේනියාව<br>2016 ඔක්තෝබර් 26 - 28 | අතිරේක නීති කෙටුම්පත් සම්පාදක<br>කේ. ආර්. වයි. හපුආරච්චි මහත්මිය |

## (3) අනෙකුත් ආයතනික හා පරිපාලන කටයුතු

i. දේශීය හා විදේශීය නීතිමය තත්ත්වයන්ගේ නව වර්ධනයන් පිළිබඳව නිලධාරීන් දැනුවත් කිරීම උදෙසා සහ ඒ පිළිබඳව ඔවුන්ගේ දැනුම හා හැකියාව වර්ධනය කිරීම ද උදෙසා දෙපාර්තමේන්තුවේ 1 වන ශ්‍රේණියේ පුස්තකාලයක් ස්ථාපිත කොට ඇති අතර, 2016 වර්ෂයේ දේශීය හා විදේශීය පොත් 142 ක් මිලදී ගෙන ඇත.

ii. සේවක සුභසාධනය වෙනුවෙන් පොදු සුභසාධක සංගමයක් පවතී. එමගින් 2016 වර්ෂයේ දී, සාමාජිකයන් සඳහා ණය පහසුකම් සැපයීම, කාර්ය මණ්ඩල අතර සුහදතාවය වර්ධනය කිරීම උදෙසා සංස්කෘතික උත්සව සහ අධ්‍යාත්මික වර්ධනය සඳහා ආගමික උත්සව පැවැත්වීම දෙපාර්තමේන්තුවේ සියලු කාර්ය මණ්ඩල සඳහා කුඩා පුස්තකාලයක් ආරම්භ කිරීම, සමාජ සත්කාරක සේවයන් සිදු කිරීම (දුෂ්කර පාසලක් වූ බුලත්කොහුපිටිය ප්‍රාථමික විද්‍යාලයේ සිසුන් සඳහා පාසල් උපකරණ බෙදා දීම) ආදිය සිදු කරන ලදී.

iii. නීති නිලධාරීන්ගේ සුභසාධනය වෙනුවෙන් නීති නිලධාරීන්ගේ සංගමයක් ද ඇත. නීති නිලධාරීන්ගේ වෘත්තිමය නිපුණතා වර්ධනය මෙන්ම අනෙකුත් සුභසාධන කටයුතු මෙම සංගමය මගින් ඉටු කරයි.

iv. දෙපාර්තමේන්තුවේ සියලුම පරිගණක ජාලගත කර ඇති අතර, සියලුම මාණ්ඩලික නිලධාරීන් මෙන්ම අනෙකුත් සුදුසු නිලධාරීන් සඳහා පරිගණක හා අන්තර්ජාල පහසුකම් ලබා දී ඇත. අනෙකුත් නිලධාරීන්ට ද පරිගණක හා අන්තර්ජාල ප්‍රවේශ පහසුකම් ලබා දී ඇත. සියලුම නිලධාරීන්ට නව තාක්ෂණය භාවිත කිරීමට අවස්ථාව ලබාදීම මගින් ඊ-රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කර ඇත.

## භාෂා පරිවර්තන අංශය

මෙම දෙපාර්තමේන්තුවේ නීති අංශය මඟින් ඉංග්‍රීසි බසින් සකස් කරනු ලබන නීති කෙටුම්පත් (නව නීති සහ සංශෝධන නීති) සහ ප්‍රතිශෝධනය කරනු ලබන උපකාරක නීති, අදාළ රාජ්‍ය භාෂාවලට පරිවර්තනය කිරීම ද දෙපාර්තමේන්තුවේ ආයතන, පාලන සහ ගිණුම් අංශවල රාජකාරි ලිපිලේඛන අදාළ භාෂාවලට පරිවර්තනය කිරීම ද භාෂා පරිවර්තන අංශය මඟින් සිදු කරනු ලබයි.

## ප්‍රකාශන අංශය

පනත් කෙටුම්පත් හා උපකාරක නීතිවල ඉංග්‍රීසි, සිංහල හෝ දෙමළ පිටපත්වල සෝදුපත් බැලීම, පරීක්ෂා කිරීම ද පාර්ලිමේන්තුව හා රජයේ මුද්‍රණාලය විසින් එවනු ලබන පනත් කෙටුම්පත්වල අත් පිටපත් හා ගුරු පිටපත් කියවා බැලීම ද නීති නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ එවැනි පිටපත් හා සම්බන්ධ සංස්කරණ කටයුතු සිදු කිරීම කරන අතරවාරයේ දී දෙපාර්තමේන්තුව සහ පාර්ලිමේන්තුව අතර සම්බන්ධීකරණ කටයුතු කිරීම ද, පනත් ගැසට් පත්‍රයේ පළ කිරීමට පියවර ගැනීම යනාදී කටයුතු නිසි ආකාරයෙන් සිදු කිරීම ද මෙම අංශය මඟින් සිදුකරනු ලබයි.

ගිණුම් අංශය

230 නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව

2016.01.01 – 2016.12.31

වැය විස්තරය

ශීර්ෂය : 230 - නීති කෙටුම්පත් සම්පාදක

වැඩ සටහන : 01 මෙහෙයුම්

ව්‍යාපෘතිය : 01 සාමාන්‍ය පරිපාලනය හා නීති කෙටුම්පත් කිරීම

(අ) 2016.01.01 සිට 2016.12.31 දක්වා පුනරාවර්තන වියදම්

| පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර | අයවැය ප්‍රතිපාදන (රු.) | ශුද්ධ ප්‍රතිපාදන (රු.) | මුලු වියදම් (රු.) | මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි<br>අනෙකුත් වියදම් | 65,500,000.00<br>21,060,000.00 | 65,500,000.00<br>21,060,000.00 | 57,232,483.83<br>19,665,707.25 | 87.38%<br>93.37% |
| පුනරාවර්තන වියදම්වල එකතුව | 86,560,000.00 | 86,560,000.00 | 76,898,191.08 | 88.83% |

2016.01.01 සිට 2016.12.31 දක්වා ප්‍රාග්ධන වියදම්

| ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර | අයවැය ප්‍රතිපාදන (රු.) | මු.රෙ. 66 අනුව මාරු කිරීම් | ශුද්ධ ප්‍රතිපාදන (රු.) | මුලු වියදම් (රු.) | මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| <u>මූලධන වත්කම්වල පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම</u><br>2001-ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 2,500,000.00 | | 2,500,000.00 | 2,479,497.56 | 99.18% |
| <u>මූලධන වත්කම් අත්පත් කර ගැනීම</u><br>2102 - ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ | 800,000.00 | 3,000,000.00 | 3,800,000.00 | 3,629,995.28 | 95.53% |

| | | | | | |
|---|---|---|---|---|---|
| **හැකියා වර්ධනය**<br>2401 - කාර්ය මණ්ඩල පුහුණු | 7,000,000.00 | | 7,000,000.00 | 6,816,452.26 | 97.38% |
| **වෙනත් මූලධන වියදම්**<br>2502 - ආයෝජන - නීති ග්‍රන්ථ මිලදී ගැනීම | 1,000,000.00 | | 1,000,000.00 | 998,585.00 | 99.86% |
| **ශ්‍රී ලංකා නීති ප්‍රඥප්ති ප්‍රතිශෝධනය කිරීම**<br>2502 - ආයෝජන | 20,000,000.00 | (3,000,000.00) | 17,000,000.00 | 1,939,828.66 | 11.41% |
| ප්‍රාග්ධන වියදම්වල එකතුව | **31,300,000.00** | | **31,300,000.00** | **15,864,358.76** | **50.68%** |

(ආ) අත්තිකාරම් ගිණුම - 230011

(2016.01.01 – 2016.12.31)

| | වියදමෙහි උපරිම සීමාව(රු.) | ලැබීම්වල අවම සීමාව (රු.) | හර ශේෂයන්ගේ උපරිම සීමාව(රු.) |
|---|---|---|---|
| 2016 ඇස්තමේන්තුව | 4,000,000.00 | 1,500,000.00 | 17,000,000.00 |
| මු.රෙ. 503(1) – 2016.12.31 දිනට ගැළපීම් කිරීමට පෙර | 3,870,863.68 | 3,019,293.00 | 10,650,498.00 |

ඩී.පී.එස්.ඒ - 1

# විසර්ජන ගිණුම 2016

වියදම් ශීර්ෂ අංකය: 230 ~~අමාත්‍යංශයේ~~/දෙපාර්තමේන්තුවේ/~~දිස්ත්‍රික්ලේකම් කාර්යාලයේ~~ නම : නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව

| වාර්ෂික ඇස්තමේන්තුවෙහි සඳහන් පරිදි වැඩසටහන් අංකය | වාර්ෂික ඇස්තමේන්තුවෙහි සඳහන් පරිදි වැඩසටහනෙහි නම | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම | (3) මු.රෙ. 66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම | (4) මුළු ශුද්ධ වෙන් කිරීම (1+2+3) | (5) මුළු වියදම | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ ඉක්මීම (4-5) | පිටු අංකය (අදාළ ඩී.පී.එස්.ඒ 2 ආකෘතියට අනුව) |
|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| | පුනරාවර්තන | | | | | | | |
| 1 | මෙහෙයුම් වැඩසටහන | 86,560,000 | - | 5,570,000<br>(5,570,000) | 86,560,000 | 76,898,191 | 9,661,809 | 2 |
| | උප එකතුව (පුනරාවර්තන) | 86,560,000 | - | 0 | 86,560,000 | 76,898,191 | 9,661,809 | |
| | ප්‍රාග්ධන | | | | | | | |
| 1 | මෙහෙයුම් වැඩසටහන | 31,300,000 | - | 3,000,000<br>(3,000,000) | 31,300,000 | 15,864,359 | 15,435,641 | 2 |
| | උප එකතුව (ප්‍රාග්ධන) | 31,300,000 | - | 0 | 31,300,000 | 15,864,359 | 15,435,641 | |
| | මුළු එකතුව | 117,860,000 | - | 0 | 117,860,000 | 92,762,550 | 25,097,450 | |

පිටු අංක 02 සිට 15 දක්වා ඩී.පී.එස්.ඒ 2 සිට ඩී.පී.එස්.ඒ 10 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 16 සිට 19 දක්වා ඇතුළත් අනෙකුත් විස්තර ද මෙම විසර්ජන ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. එබැවින් ඉහත ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් තොරතුරු හා සටහන්වලට අනුකූලව පිළියෙල කර ඇති බවත්, භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ අදාළ ගිණුම් සැසඳීම් කර ඇති බවත්, ඒවා නිවැරදි බවට තහවුරු වී ඇති බවත් මෙයින් සහතික කරමි.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 2017.03.27

ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 17.03.2017

දිලාන් කුමාරසිංහ
නීති කෙටුම්පත් සම්පාදක
නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව
අංක. 80, අධිකරණ මාවත,
කොළඹ 12.

~~ප්‍රධාන මූල්‍ය නිලධාරි~~/ ප්‍රධාන ගණකාධිකාරි/ ~~අධ්‍යක්ෂ(මුදල්)/කොමසාරිස් (මුදල්)~~
නම :
දිනය : 2017.03.15

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT
විගණන විමසුම-AUDIT QUERY- கணக்காய்வு விசார

විමසීම් අංකය / விசாரணை இலக்கம / Ouerv No.. JPA/B/LDD/02/16/APP/20/AQ 2

නිකුත් කරන දිනය / வழங்கிய திகதி / Date of issue 2017 අප්‍රේල් 27 දින

Addressed to / වෙතටයි නීති කෙටුම්පත් සම්පාදක
ශීර්ෂ 230 - නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව

විෂයය / Subject / விடயம் විසර්ජන ගිණුම් විගණනය - 2016

මෙය පැහැදිලි කිරීම සඳහා තොරතුරු කැඳවීමක්/විමසීමක් වන අතර විගණන වාර්තාවක් නොවේ.
This is only query calling for information for clarification and not an audit report
இவ்விசாரணை தகவல்களைப் பெற்றுக் கொள்ளவும், பகுப்பாய்வதற்காகவுமே அன்றி இது ஒரு கணக்காய்வு அறிக்கை அல்ல.

යථෝක්ත විසර්ජන ගිණුම සම්බන්ධයෙන් කරනු ලැබූ විගණන පරීක්ෂණයේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

1) ප්‍රතිපාදන ඌන උපයෝජනය

අ) මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල නොකිරීමත් කළමනාකරණය විසින් නියමිත කාල වකවානු තුළදී නිශ්චිත කාර්යසාධන ඉලක්ක සපුරා ගැනීමට කටයුතු නොකිරීමත් නිසා පහත සඳහන් ප්‍රතිපාදන වලින් ඉතිරිවීම සියයට 34 සිට 89 දක්වා පරාසයක පැවතුණි.

| වැය විෂය හා විස්තරය | ශුද්ධ ප්‍රතිපාදනය<br>රු. | වියදම<br>රු. | ඉතිරිය<br>රු. | ප්‍රතිශතය<br>% |
|---|---|---|---|---|
| 230 -1 - 1 – 1002 අතිකාල හා නිවාඩු වැටුප් | 800,000 | 527,007 | 272,993 | 34 |
| 230 -1 - 1 – 1003 වෙනත් දීමනා | 36,500,000 | 28,700,650 | 7,799,350 | 21 |
| 230 -1 - 1 – 1101 දේශීය ගමන් වියදම් | 10,000 | 6,125 | 3,875 | 39 |
| 230-1 -1 -1- 2502 ආයෝජන | 17,000,000 | 1,939,829 | 15,060,171 | 89 |

අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, புத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka
දුරකථනය / தொலைபேசி / Telephone. 2887028 -34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. oaggov@sltnet.lk

ආ) නීති ප්‍රඥප්ති ප්‍රතිශෝධනය කිරීමේ හා ඒකාබද්ධ කිරීම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂික ඇස්තමේන්තුව මගින් ප්‍රතිපාදනය කර තිබූ රු. මි. 20 න් රු. මි. 3 ක් මු.රෙ.66 මගින් ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ මිලදී ගැනීමට 1 -1 - 2102 වැය ශීර්ෂයට මාරු කිරීමෙන් අනතුරුවද, 89% ක ඉතිරිවීමක් තිබුණි.

**2) ඉතිරි වීම් සඳහා දක්වා ඇති පැහැදිලි කිරීම් පිළිගත නොහැකි වීම.**

පහත සඳහන් ඉතිරිවීම් සම්බන්ධයෙන් දක්වන ලද පැහැදිලි කිරීම් විගණනයේ දී පිළිගත නොහැකි වීම.

| වැය විෂය හා විස්තරය | ඉතිරිය | ඉතිරියේ ප්‍රතිශතය | ඉතිරිවීම් සඳහා පැහැදිලි කිරීම් | විගණන නිරීක්ෂණ |
|---|---|---|---|---|
| | රු. | | | |
| 230-1-1-1-2502 ශ්‍රී ලංකා නීති ප්‍රඥාප්ති ප්‍රතිශෝධන ව්‍යාපෘතිය | 15,060,171 | 89 | ව්‍යාපෘතියේ කටයුතු අතරින් විශාල කාර්ය්‍යා කොටසක් දෙපාර්තමේන්තුවේ නීති කෙටුම්පත් සම්පාදක නිලධාරීන් විසින්ම සිදු කිරීම හා පනත් විශාල ප්‍රමාණයක් වැඩ කරන ලැබූ නිසා කාලය ප්‍රමාණවත් නොවීම හා 2016/05/01 දින තෙක් සම්බන්ධීකරණ නිළධාරියෙකු නොමැති වීම. | දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ව්‍යාපෘතියේ කටයුතු වල යෙදෙන තත්ත්වයක් යටතේ වසරකට ලැබේ යැයි අපේක්ෂිත පනත් සංඛ්‍යාව පිළිබඳ අවබෝධයක් වසර කිහිපයක දී දෙපාර්තමේන්තුවට ලැබෙන පනත් පිළිබඳ අධ්‍යනයෙන් ලබා ගෙන සැලැස්මකට අනුව කටයුතු කළ හැකිව තිබිය දී එසේ නොකර අධි ඇස්තමේන්තු සකස් කිරීම නිසා මෙම ඉතිරිවීම් සිදු වී තිබෙන අතර 2016 වර්ෂයේ දී භාෂා පරිවර්තකයින් 12 දෙනෙකු ද, ලේඛණ සහකාර නිලධාරීන් 08 ක් සහ සංස්කාරක නිලධාරීන් 08 දෙනෙක් බඳවා ගෙන ඇත. මෙම කරුණු නිසා ඉතිරිවීම් වලට හේතු පිළිගත නොහැක. |

3) පාඩු හා හානි

---------------

ඩී.පී.එස්. ජී.7 ආකෘතියට ඇතුළත් කර තිබුණු පහත සඳහන් පාඩු හා හානි පිළිබඳ සටහන් හානි හා පාඩු ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි.

අ) 2015 නොවැම්බර් මාසයේදී K M -0905 දරන මෝටර් රථයේ ස්වයංක්‍රිය යතුර නැතිවීම පිළිබඳව 2016-12-31 දිනට පවතින තත්ත්වය(වටිනාකම රු.20,281)

ආ) KA – 6946 දරන මෝටර රථයේ අනතුර (වටිනාකම රු.2,050)

4) භාණ්ඩ සමීක්ෂණය

---------------------

2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2016 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2016 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණන දිනය 2017 අප්‍රෙල් 27 වන විටද විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

යථෝක්ත කරුණු පිළිබඳව ඔබගේ නිරීක්ෂණ හා ගනු ලබන ක්‍රියාමාර්ග දින 03 ක් ඇතුළත විගණනය වෙත ඉදිරිපත් කරන මෙන් කාරුණිකව ඉල්ලමි.

එච්.එම්.එස්.කේ. සිරිවර්ධන
විගණන අධිකාරි
සහකාර විගණකාධිපති වෙනුවට

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. JPA/B/LDD/02/16/APP/20 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2017 මැයි 30 දින.

අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව.

**ශීර්ෂ 230 - නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ 2016 වර්ෂයේ විසර්ජන ගිණුම පිළිබඳව විගණකාධිපති වාර්තාව**

ශීර්ෂය 230 - නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ 2016 වර්ෂය සඳහා වූ 2016 දෙසැම්බර් 09 දිනැති අංක 252/2016 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ සඳහන් ඩීජීඑස්ජී 1 ආකෘතියේ සිට 10 ආකෘතිය දක්වා ආකෘතිද, සටහන (i) සිට සටහන (iv) දක්වා වූ තොරතුරු සාරාංශයකින් සමන්විත 2016 වර්ෂය සඳහා වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්ට, 2016 අංක 23 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2015 අංක 16 දරන විසර්ජන පනත හා වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්ට, 2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුවට, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධිවිධාන ඇතුළත් රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පිළියෙල කර ඉදිරිපත් කරන ලද විසර්ජන ගිණුම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2016 දෙසැම්බර් 09 දිනැති අංක 252/2016 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 150 ප්‍රකාරව රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ප්‍රසිද්ධ කළ යුතු විසර්ජන ගිණුම සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

2. විගණන විෂය පථය

විසර්ජන ගිණුමේ දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන 2016 අංක 23 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2015 අංක 16 දරන විසර්ජන පනතින් පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරන ලද වියදම් සීමාවන් තුළ උපයෝජනයන් සිදු කලේද යන්න හා විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් විසර්ජන ගිණුමේ ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම විසර්ජන ගිණුමේ සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

3. විසර්ජන ගිණුම සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 52 ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 හා 125 හි දක්වා ඇති කාර්යභාරයන් සම්බන්ධයෙන් වූ රාජ්‍ය මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු කිරීම සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් මුදල් අමාත්‍යවරයාට වගකිව යුතු අතර අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුවල මුදල් කටයුතු අධීක්ෂණය කිරීමේ වගකීම භාණ්ඩාගාරයේ විධානයන්ට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ට හා ගණන්දීමේ නිලධාරීන්ට පැවරේ. ඒ අනුව විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්ට, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්ට, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙනයාම, පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ විසර්ජන ගිණුම පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාම මෙම වගකීමට ඇතුළත් වේ.

4. විගණන නිරීක්ෂණ

2016 වර්ෂය සඳහා ශීර්ෂ 230 දරන නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම පහත දැක්වෙන 4.1 ඡේදයට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

4.1 1956 සිට පනවන ලද නීති ප්‍රඥප්ති ප්‍රතිශෝධනය කිරීමේ හා ඒකාබද්ධ කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා නොගෙන 2011, 2012 හා 2013 යන වර්ෂ 03 දී ප්‍රතිපාදන සලසා ගෙන තිබීම හේතුවෙන් එම වර්ෂ 03 දී සලසා ගෙන තිබුණු මුළු ප්‍රතිපාදන රු.132,500,000 ක් සම්පූර්ණයෙන්ම ඉතිරිවී තිබුණි. 2014 පෙබරවාරි 28 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණු නමුත් 2014, 2015 හා 2016 යන වර්ෂවලදී සලසා ගෙන තිබුණු ප්‍රතිපාදන උපයෝජනයේ ප්‍රගතිය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 2 ත් සියයට 12 ත් අතර පරාසයක අඩු අගයක් විය. විස්තර පහතින් දැක්වේ.

| වර්ෂය | මුළු ශුද්ධ ප්‍රතිපාදනය | වියදම | ඉතිරිය | ඉතිරිය මුළු ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | සියයට |
| 2014 | 32,175,000 | 659,934 | 31,515,066 | 98 |
| 2015 | 60,000,000 | 2,102,258 | 57,897,742 | 96 |
| 2016 | 17,000,000 | 1,939,829 | 15,060,171 | 88 |

5. පාර්ලිමේන්තුව වෙත වාර්තා කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාර මා විසින් ශීර්ෂ 230 ට අදාළව මූල්‍ය හා කාර්යසාධනය පිළිබඳ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

අයි.සමරගේ
සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

පිටපත - 1. ලේකම්, අධිකරණ අමාත්‍යාංශය
2. නීති කෙටුම්පත් සම්පාදක, නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව

## ආයතනයේ කාර්ය සාධනය පිළිබඳ සාරාංශය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව විවිධ විෂයන් පිළිබඳව ආණ්ඩුවේ ප්‍රතිපත්තීන් ලිඛිත නීතිය බවට පරිවර්තනය කිරීම නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ මූලික කාර්යභාරය වේ. මෙම ක්‍රියාවලියේ දී නව පනත් කෙටුම්පත් සම්පාදනය කිරීම, පවත්නා නීති සංශෝධනය (amendment) කිරීම, පනත් කෙටුම්පත් ප්‍රතිශෝධනය (consolidation) කිරීම සහ අදාළ අමාත්‍යාංශ ඉදිරිපත් කරනු ලබන අනුනීති පුනරීක්ෂණය (revision) කිරීම ද සිදු කරනු ලැබේ. පනත් කෙටුම්පත් පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා පාර්ලිමේන්තු තේරීම් කාරක සභා රැස්වීම්වලට සහභාගි වීම සහ පනත් කෙටුම්පත් විවාදයට ගැනීමේ දී පාර්ලිමේන්තුවට ගොස් අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය කිරීම සහ අනුනීති සැකසීම සම්බන්ධයෙන් ආණ්ඩුවේ නොයෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට නෛතික උපදෙස් ලබාදීම ද මෙම දෙපාර්තමේන්තුව විසින් සිදු කරයි.

තව ද, ශ්‍රී ලංකාවේ නීති ප්‍රඥප්ති නිල වශයෙන් ඒකාබද්ධ කොට සහ ප්‍රතිශෝධනය කොට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් ප්‍රකාශයට පත්කිරීමේ වසර හතරක ව්‍යාපෘතියේ කටයුතු සිදු කරමින් පවතී.

'නීති කෙටුම්පත් සම්පාදක අංශය' යටතේ නිශ්චිතව දක්වා ඇති පරිදි, 2016 වර්ෂයට අදාළව නීති කෙටුම්පත් සම්පාදනය සම්බන්ධව පියවර ගෙන ඇත.

36

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව
අංක 80, අධිකරණ මාවත,
කොළඹ 12.

...ஞர் திணைக்களம்,
..., அதிகரண மாவத்தை,
...மும்பு 12.

තැ.පෙ. / அ.பெ. / P.O.Box 554

LEGAL DRAFTSMAN'S DEPARTMENT,
N0.80, Adhikarana Mawatha,
Colombo 12.

දුරකථන / தொலைபேசி / Telephones : 0112 333394

විදුලි පණිවුඩ : කෙටුම්පත්, කොළඹ
Telegrams : DRAFTSMAN, Colombo

ෆැක්ස් /பெக்ஸ் /Fax: 0112325185,0112 435935

E –mail : ldds1@sltnet.1k

මගේ අංකය. / எனது இல / **My No.** LDD/AC/06/06
ඔබේ අංකය. / உமது இல. / **Your No.** JPA/B/LDD/02/16/APP/20/AQ2
දිනය. / திகதி / **Date.** 23 /05/2017

සහකාර විගණකාධිපති,

විගණකාධිපති දෙපාර්තමේන්තුව,

බත්තරමුල්ල.

විසර්ජන ගිණුම් විගණනය - 2016

<u>ශීර්ෂ 230 - නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව</u>

උක්ත මැයෙන් මා අමතන ලද ඔබගේ සමාංක හා 2017.04.27 දිනැති ලිපිය සම්බන්ධයෙනි.

ඒ අනුව උක්ත ලිපියෙහි සඳහන් කරුණු පිළිබඳව නිරීක්ෂණ සහ ගනු ලබන ක්‍රියා මාර්ග පහත පරිදි ඉදිරිපත් කරනු ලැබේ.

01. <u>(අ) ප්‍රතිපාදන ඌන උපයෝජනය</u>

| වැය විෂය | වැය විෂය විස්තරය | ඉතිරිවීමේ ප්‍රතිශතය % | ප්‍රතිපාදන ඉතිරිවීමට හේතුව |
|---|---|---|---|
| 230-1-1-1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 34 | අතිකාල සීමා කිරීම |
| 230-1-1-1003 | වෙනත් දීමනා | 21 | 03/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව වැටුප් පරිවර්තනය කිරීමේදී මෙම වැය විෂය යටතේ වෙන් කරන ලද දීමනා මූලික වැටුපට එකතු වීම. |
| 230-1-1-1101 | දේශීය ගමන් වියදම් | 39 | ගමන් වියදම් ඉල්ලීම සීමා වීම |
| 230-1-1-2502 | ආයෝජන | 89 | ව්‍යාපෘතියෙහි කටයුතු අතරින් විශාල කාර්යය කොටසක් දෙපාර්තමේන්තුවේ නීති කෙටුම්පත් සම්පාදක නිලධාරීන් විසින්ම සිදුකරයි.2016 වසරේ පනත් විශාල ප්‍රමාණයක වැඩ කරනු ලැබූ බැවින් ඔවුනට කාලය ප්‍රමාණවත් නොවීම හා 2016.05.01 දින තෙක් සම්බන්ධීකරණ නිලධාරියෙකු නොමැති වීම හේතුවෙන් නියමිත ඉලක්කය වෙත ළඟා වීමට අපහසු වීම. |

(ආ) ඉතිරි වීම් සඳහා හේතු ලෙස මීට පෙර ඉදිරිපත් කල පිළිතුරු තවදුරටත් වලංගු බව කාරුණිකව දන්වමි.

02. <u>**ඉතිරි වීම් සඳහා දක්වා ඇති පැහැදිලි කිරීම් පිළිගත නොහැකි වීම.**</u>

විගණන නිරීක්ෂණ මගින් ඉතිරිවීම් සඳහා මෙම දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කළ හේතු පිළිගත නොහැකි බව දන්වා ඇති බැවින් එම හේතු වලට වැඩිමනක් වශයෙන් පහත සඳහන් කරුණු කෙටියෙන් දන්වා සිටිමි.

2016 වසරේ දී ඉටු කිරීමට අපේක්ෂිත කාර්යය පහත හේතු නිසාවෙන් පූර්ව නිගමනය කිරීමට නොහැකි වීම.

- ආණ්ඩුව වෙනස් වීමත් සමග රජයේ නව ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා අලුතින් නීති ගෙන ඒම සඳහා විශාල කාර්යයක් මෙම දෙපාර්තමේන්තුවට පැවරීම.
- ජී එස් පී + ලබා ගැනීම සඳහා නව නීති සෑදීමට සිදුවීම.
- සෑම කෙටුම්පතක්ම / උපකාරක නීතියක්ම ඉතා හදිසි ඒවා බවට පත්වීම

තවද මෙම දෙපාර්තමේන්තුව සඳහා අලුතින් බඳවා ගැනීම් සිදුකළ ද එම නිලධරයන් ව්‍යවස්ථාපිත නීති ඒකාබද්ධ කිරීමේ සහ ප්‍රතිශෝධනය කිරීමේ වැඩකටයුතු සඳහා සෘජුවම සම්බන්ධ වන නිලධාරීන් නොවන අතර , සෘජුවම සම්බන්ධ වන බොහෝ නිලධාරීන් නවක නිලධරයන් වීම. එම නිලධරයන් ද රාජකාරි ඉටු කරනුයේ ජ්‍යෙෂ්ඨ නිලධරයන්ගේ මඟ පෙන්වීම මත වන අතර, ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සිටිනුයේ ඉතා සීමිත ප්‍රමාණයකි.( නියෝජ්‍ය මට්ටමේ නිලධාරීන් 05 ක් හා ජ්‍යෙෂ්ඨ සහකාර මට්ටමේ එක් නිලධරයෙක් පමණි.)

3. <u>පාඩු හා හානි</u>

(අ) 2016 මාර්තු මස සිට දෙසැම්බර් දක්වා මසකට රු **2,028.18** බැගින් රු **20,281.80** ක් අයකරගෙන ඇත. අතපසු වීමකින් පාඩු හා හානි ලේඛනයේ එහි 2016.12.31 දිනට පවතින තත්වය සටහන් කර නොතිබුණි. අදාල නිලධාරියාගෙන් එය අය කර ගත් බවට සහතික කිරීම සඳහා වැටුප් ලේඛනයේ සහතික කල ඡායා පිටපතක් මේ සමග අමුණා ඇත. **(ඇමුණුම-01)**

(ආ) මෙය 2011 දී සිදුවූ අනතුරකි . එය හානි හා පාඩු ලේඛනයේ සටහන් කර ඇත.අදාල වාර්තා කිරීමේ ඡායා පිටපත මේ සමග අමුණා ඇත. **(ඇමුණුම-02)**

4) <u>**භාණ්ඩ සමීක්ෂණය**</u>

2016 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පවත්වා එම වාර්තා ලේකම් , අධිකරණ අමාත්‍යාංශය හා අභ්‍යන්තර විගණක අංශය, අධිකරණ අමාත්‍යාංශය වෙත පිටපත් සහිතව විගණකාධිපති වරයා වෙත 2017.04.20 දින යවා ඇත.
(එම ආවරණ ලිපියෙහි පිටපතක් මේ සමඟ අමුණා ඇත.) **(ඇමුණුම-03)**

ඩී එස් එච් කුමාරජීව
නීති කෙටුම්පත් සම්පාදක

## ආයතනයේ කාර්ය සාධනය ඉහළ නැංවීම පිණිස ගැනීමට අපේක්ෂිත මධ්‍යකාලීන ක්‍රියාමාර්ග

(i) විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ මන්ත්‍රීවරුන් පෞද්ගලිකව ඉදිරිපත් කරනු ලබන පනත් කෙටුම්පත් කිරීම, හා පනත් සංශෝධන කෙටුම්පත් සඳහා වන ඉල්ලීම් කඩිනමින් සකස් කර භාෂාත්‍රයෙන් ඉදිරිපත් කිරීමට ගත යුතු පියවර පිළිබඳ සියලු නීති නිලධාරීන් නිරතුරුවම දැනුවත් කර ඇත.

(ii) පළපුරුදු ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ හිඟය යම්තාක් දුරට මගහරවා ගැනීමට නීති කෙටුම්පත් කිරීමේ කාර්යයන් සඳහා උපදේශකවරුන් සිව්දෙනෙකු බඳවා ගෙන ඇත.

(iii) පනත් කෙටුම්පත් කිරීමේ කටයුතු අප්‍රමාදව සිදුකිරීම සඳහා අවශ්‍ය නීති නිලධාරීන් බඳවා ගැනීම සිදු කරන ලදී.

(iv) පනත් කෙටුම්පත් හා සංශෝධන පනත් කෙටුම්පත් වල භාෂා පරිවර්තන කටයුතු සඳහා ප්‍රමාණවත් භාෂා පරිවර්තන නිලධාරීන්ගේ හිඟකමක් පැවති අතර ඒ සඳහා අවශ්‍ය සිංහල සහ දෙමළ භාෂා පරිවර්තක නිලධාරීන්ගේ බඳවා ගැනීම් සිදු කරන ලදී.

(v) පනත් කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලියට සහාය වන ලේඛන සහකාර සහ සංස්කාරක තනතුරුවල පුරප්පාඩු සපුරමින් ඒ සඳහා අවශ්‍ය බඳවා ගැනීම් සිදු කර ගන්නා ලදී.

(vi) නීති නිලධාරීන්ගේ සහ අනෙකුත් කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ දැනුම හා හැකියාව වර්ධනය කිරීම ඉලක්ක කරගත් විවිධ පුහුණු වැඩසටහන්වලට සහභාගිවීම සඳහා පුළුල් පරාසයක විහිදුනු අවස්ථාවන් ඔවුන්ට ලබා දී තිබේ.

(vii) දෙපාර්තමේන්තුවේ ස්ථාපිත කොට ඇති 'අ' ශ්‍රේණියේ පුස්තකාලය මඟින් දේශීය සහ විදේශීය නීති පොත් පරිශීලනය කිරීමේ පහසුකම් සපයා දී ඇත.

(viii) නීති නිලධාරීන් ඇතුළු දෙපාර්තමේන්තුවේ අනෙකුත් සියලුම කාර්ය මණ්ඩලය රාජකාරි වේලාවන්හි දී රාජ්‍ය සේවයේ ගෞරවය ආරක්ෂා වන පරිදි සේවයෙහි නියුතු විය යුතු බවට පැහැදිලි උපදෙස් නිරතුරුව ලබා දෙන අතර නීති නිලධාරීන් මෙන්ම අනෙකුත් සියලුම කාර්ය මණ්ඩල ආදර්ශවත් පරිදි ස්වකීය රාජකාරි කටයුතු ඉටු කරනු ලබන බව ද සඳහන් කළ යුතු ව ඇත.